# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.01.09 පැය 1015 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

### 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර

2025.01.08 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මීගොඩ පොලිස් වසමේ මීගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගොඩ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර

2025.01.08 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හංවැල්ල පොලිස් වසමේ තල්ගස්හේන ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ පන්නවල, වග ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හංවැල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 03. බලපත්‍ර නොමැතිව විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.

2025.01.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොලිස් වසමේ පොලිස් වසමේ හංවැල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව විදේශීය රටක නිෂ්පාදිග ගිනි අවියක් හා එම පතරොම් 05 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වූ කොස්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හංවැල්ල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව විදේශීය රටක නිෂ්පාදිත මත්පැන් මුදලට විකිණීම හා සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2025.01.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බදුල්ල පොලිස් වසමේ ලිදමුල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව විදේශීය රටක නිෂ්පාදිත විවිධ ප්‍රමාණයේ මත්පැන් බෝතල් 24 ක් මුදලට විකිණීම හා සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බදුල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයදස අවුරුදු 41 ක් වූ බදුල්ල ප්‍රෙද්ශයේ පදිංචිකරුවෙකු වේ.**

බදුල්ල පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**